සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

12 ශ්‍රේණිය

# යුරෝපා ඉතිහාසය


පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. (3) | 02. (5) | 03. (4) | 04. (2) | 05. (5) | 06. (2) | 07. (4) | 08. (2) | 09. (2) | 10. (1) |
| 11. (3) | 12. (2) | 13. (1) | 14. (4) | 15. (2) | 16. (1) | 17. (5) | 18. (2) | 19. (3) | 20. (4) |
| 21. (5) | 22. (4) | 23. (2) | 24. (2) | 25. (3) | 26. (4) | 27. (4) | 28. (1) | 29. (4) | 30. (3) |
| 31. (2) | 32. (3) | 33. (2) | 34. (3) | 35. (3) | 36. (3) | 37. (2) | 38. (1) | 39. (4) | 40. (5) |

## II කොටස

01




ලකුණු කළ ස්ථානයන් දෙකක් පිළිබඳව කෙටි සටහන් ලිවිය යුතුය.
ලකුණු කළ ස්ථාන සඳහා ලකුණු 8 ක් ද, කෙටි සටහන් වලට ල. 05 බැගින් ල. 10 ක් ද වේ.

02. 1618 සිට 1648 දක්වා පැවති තිස් අවුරුදු යුද්ධය ඇති වීමට ප්‍රධානම හේතුව 1555 දී ඇති වූ ඔග්ස්බර්ග් සමථයේ දුර්වලතාය. ඔග්ස්බර්ග් සමථය මගින් කැල්වින් වාදීන්ට වරප්‍රසාද නොලැබුණි. බෙවෙරියාවේ මැක්සිමිලියන් රෝමානු කතෝලික නායකයා වූ අතර රෙපරමාදු සංගමයේ නායකයා ප්ලැටිනේට් හි ෆෙඩ්රික් ය. මෙයත් ගැටුමට මුල්විය. ශුද්ධ රෝම අධිරාජයාගේ බලය ව්‍යාප්ත වීමට ජර්මනියේ කුමාරවරු අකැමැති වීම මෙන්ම හැප්ස්බර්ග් හා බූර්බන් රාජවංශ අතර තිබුණු තරගය ද යුද්ධ වලට හේතු විය.

යුද්ධයේ ප්‍රධාන අවස්ථා 4 ක් විය. (1) බොහිමියන් අවධිය (2) ඩෙන්මාර්ක් අවධිය (3) ස්වීඩන් අවධිය (4) ප්‍රංශ අවධිය

- ⋆ තිස් අවුරුදු යුද්ධය අවසානයේ 1648 දී වෙස්ට්ෆේලියා ගිවිසුම ඇති වීම.
- ⋆ බූර්බන් වංශය බලවත් වී ප්‍රංශයට ප්‍රධාන ස්ථානයක් හිමි වීම.
- ⋆ ජර්මන් කුමාරවරුන්ට ස්වාධීන පාලකයන් ලෙස කටයුතු කිරීමට හැකි වීම. ගිවිසුමෙන් කැල්වින්වාදීන්ටත් වරප්‍රසාද හිමි විය.
- ⋆ ජර්මනියේ මිනිස් ඝාතන හා දේපල විනාශ ද රැසක් විය.
- ⋆ මෙයින් පසු ආගමික යුද්ධ ඇති නොවීය.

03. I වන ලෝක යුද්ධයට වැරදිකරු වූයේ ජර්මනියයි. සිදුවූ මනුෂ්‍ය ඝාතන, විනාශයන් අතිමහත්ය. ඇමරිකාව ද යුද්ධයට සහභාගී වී ජර්මනිය යුද්ධයෙන් අන්ත පරාජයට ලක්කරන ලදී. වර්සෙල්ස් ගිවිසුම මගින් ජර්මනියට දඬුවම් හා වන්දි මුදල් නියම කිරීම මත II ලෝක යුද්ධයට මඟ පෑදුණු ප්‍රධාන හේතුවක් බවට එය පත්වූ බව කිව හැකිය.

ජර්මනියට ඇල්සාස් ලෝරේන් අහිමි විය. තවද ජර්මනියේ කාර්මික නිශ්පාදන ඇණහිටිනි. හිට්ලර්ගේ බලය ඉස්මතු වීමට මෙම කරුණ බලපෑවේය.

තවද ඉතාලියේ I ලෝක යුද්ධයෙන් පසුව පැවති තත්වය ද එයට හේතු විය. මුසලෝනියේ පැසිස්ට්වාදී පාලනයත්, හිට්ලර්ගේ නට්සිවාදයත් නිසා මෙන්ම ජපානයේ ආක්‍රමණකාරී හැසිරීම් ද හේතුවෙන් II ලෝක යුද්ධයහට ගැනුනි.

⋆ ජාතීන්ගේ සංගමය ද බිඳ වැටීම නිසා යුද්ධය වැළැක්වීමට නොහැකි වුණි.

04. I ආසන්නම සිද්ධීන් 16 වන ලුවී ස්ටේට්ස් ජනරාල් සභාව කැඳවීම. වර්සායි මාලිගය අවට රැස්වී පාන් ඉල්ලමින් කෑ ගහපු ජනතාවට බිසව විසින් පාන් නැත්නම් කේක් කාපල්ලා යැයි පිළිතුරු දීම. බැස්ටීලයට පහරදී සිරකරුවන් එළියට ගැනීම.

II
- 1792 ප්‍රංශ සමූහාණ්ඩුව පිහිටුවීම,
- 1798 දී 16 වන ලුවී රජු මරා දැමීම
- 1793 1795 කීට සමය
- ජැකොබියන් වරු අතර ගැටුම්
- තර්මිඩෝරියන් ප්‍රතිවිප්ලවය
- අධ්‍යක්ෂක මණ්ඩලය බලයට පත්වීම
- කොන්සල් ක්‍රමය ආරම්භ වීම
- නැපෝලියන් බලයට පත්වීම

III
- ⋆ රටේ සියලුම බලතල රජු වෙත කේන්ද්‍රණය වූ පාලන ක්‍රමයක් වීම.
- ⋆ රදළයින් බදු නොගෙවා අධික වරප්‍රසාද භුක්ති විඳිමින් සිටින අතර සාමාන්‍ය ජනයා අධික බදු බරකින් පෙළෙමින් සිටීම.
- ⋆ අධික යුද වියදම්
- ⋆ බදු ප්‍රතිපත්තිය ඉතා දුර්වල වීම.
- ⋆ මධ්‍යම පන්තිය දියුණුවට බාධා සළුල වීම
- ⋆ දාර්ශනික අදහස් මතු වෙමින් තිබුණි. වොල්ටෙයාර්, මොන්ටෙස්කියු, රූසෝ, හොබ්ස්

IV
- මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය එළි දැක්වීම
- ධනවාදී ආර්ථික රටාවක් බිහි වීම
- මධ්‍යම පන්තියට දේශපාලන අයිතිවාසිකම් හිමි වීම
- රදළ හා පූජක පන්තිය සතු වූ ඉඩම් අහිමි වීම
- සමාන බදු ක්‍රමයක් ඇති වීම
- සුළු ඉඩම් හිමි ගොවි පන්තියක් බිහි වීම.
- නිදහස, සමානාත්මතාවය හා සහෝදරත්වය යන අදහස් යුරෝපය පුරා පැතිරීම
- නැපෝලියන් බලයට පත්වීම.

05. I කලාව හා ගෘහ නිර්මාණ ශිල්පය
- ⋆ ඉතාලියේ ධනවත් පවුල්වල ආධාර ලබමින් චිත්‍ර කලාව ආදිය දියුණු විය.
- ⋆ ලියනාඩෝ ඩාවින්චි, මයිකල් ඇන්ජිලෝ, රෆායෙල් වැනි දක්ෂ කලාකරුවන් බිහිවීම.
- ⋆ ලෞකිකත්වයට නැඹුරු වූ කලාවක් තිබීම.
- ⋆ මොනාලිසා වැනි චිත්‍ර මෙන්ම ඩේවිඩ් පියෙටා වැනි මූර්ති ද, රෝම ගෘහ නිර්මාණ ශිල්පයට අදාළ වෘත්තාකාර ආරුක්කු සහ වහල වලින් යුත් ගොඩනැගිලි, ග්‍රීක ලතින් සාහිත්‍යය ද දියුණු වීම.

II ආණ්ඩුක්‍රම හා දේශපාලනය

ජාතික රාජ්‍යයක් බිහි වීම හා රදළ බලය වර්ධනය වී සංකේන්ද්‍ර ගත පාලන ක්‍රමයක් අනුගමනය කිරීම. ස්පාඤ්ඤය, එංගලන්තය හා ප්‍රංශය උදාහරණ වේ.

III විද්‍යාව
- ලෝකය ගෝලාකාර බව මැගලන් ලොව වටා යෑමෙන් ඔප්පු වීම.
- කෙප්ලර්, කොපර් නිකස් ද මත පල කිරීම.
- අයිසක් නිව්ටන් ගුරුත්වාකර්ෂණය සොයා ගැනීම.
- ගුටෙන්බර්ග් මුද්‍රණ යන්ත්‍රය සොයා ගැනීම.
- පැරසෙල්සස් හා විලියම් හාවේ රුධිර සංසරණ පද්ධතිය සොයා ගැනීම ආදී වූ විද්‍යාත්මක සොයා ගැනීම් රැසක් සිදුවිය.

06.
- මධ්‍යතන යුගයේ වූයේ කෘෂිකර්මාන්තය මත පදනම් වූ ස්වයංපෝෂිත ආර්ථික රටාවකි. ප්‍රවේණි ක්‍රමය දක්නට ලැබුණි. රදළයින්ට බදු ගෙවමින් ඉඩම් වල සේවය කළහ. ග්‍රාමීයත්වය දක්නට ලැබුණි. භාණ්ඩ හුවමාරුව තිබුණි. මුදල් භාවිතය තිබුණේ ස්වල්ප වශයෙනි. වෙළඳාම ද දක්නට ලැබුණි.
- නූතන යුගයට එළැඹීමත් සමග කෘෂිකර්මාන්තය හා ස්වයංපෝෂිත ආර්ථික රටාව බිඳ වැටීම මෙන්ම වෙළඳාම පුළුල් වීම නාගරිකරණයට ලක්වීම. ප්‍රවේණි ක්‍රමය බිඳවැටීම, ඉඩම් හිමි ගොවි පන්තියක් ඇති වීම. මුදල් භාවිතය බහුල වීම, නව මධ්‍යම පන්තියක් බිහි වීම, බැංකු ක්‍රම, බද්ධ ව්‍යාපාර සමාගම් බිහිවීම හා ධනවාදයේ ආරම්භය.
- රජු, රදළ පන්තිය හා සාමාන්‍ය ජනයා (ප්‍රවේනි දාසයා) යනුවෙන් සමාජ ස්ථර විය.
- නූතන යුගයට එළැඹෙන විට ප්‍රවේණි ක්‍රමය බිඳ වැටී සාමාන්‍ය ජනයාගේ තත්වය යහපත් විය.

07. I
- ⋆ නව මුහුදු මාර්ග සොයා ගැනීමට ඇති වූ උනන්දුව
- ⋆ කොන්ස්තන්තිනෝපලය මුස්ලිම්වරුන් අතට පත්වීම නිසා ආසියාවට පැමිණීමට තිබූ ගොඩබිම් මාර්ග අවහිර වීම.
- ⋆ ගවේෂණ කටයුතු සඳහා රාජ්‍ය අනුග්‍රහය සහ මධ්‍යම පන්තිකයන්ගේ අනුග්‍රහය
- ⋆ ඉස්ලාම් ආගමට විරුද්ධ ක්‍රිස්තු ධර්මය ප්‍රචාරය කිරීමේ අරමුණ.
- ⋆ කීර්තිය ලැබීමේ අවශ්‍යතාව
- ⋆ විද්‍යාත්මක සොයා ගැනීම් නිසා ආරක්ෂා සහිතව මුහුදු ගමන්වල යෙදීමට හැකි වීම.
- ⋆ ආසියාවේ මුස්ලිම්වරු අත තිබූ ආසියාවේ වෙළඳ ආධිපත්‍ය අත්පත් කර ගැනීම.

II
- ආසියා, අප්‍රිකා, ලතින් ඇමරිකා යන මහද්වීප වල යුරෝපා බලය ව්‍යාප්ත වීම.
- නව වෙළඳ නගර බිහිවීම.
- කාර්මික විප්ලවයට මඟ පෑදීම.
- ක්‍රිස්තු ධර්මය ආසියා, අප්‍රිකා, ඇමරිකා මහද්වීප වල පැතිර වීම.
- යුරෝපා සංස්කෘතිය හා තාක්ෂණය ලොව පුරා ව්‍යාප්ත වීම.
- ආසියා, අප්‍රිකා මහද්වීප වල නව වෙළඳ භාණ්ඩ පෙර අපර දිග වෙළඳාමට එකතු වීම.
- යුරෝපීය අධිරාජ්‍යයක් ගොඩනැගීම.
- නව විදේශ සම්බන්ධතා ඇතිවීම.

The National e-learning Portal for The General Education